Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# බොරලැස්ගමුව නගර සභාව

බොරලැස්ගමුව නගර සභාවේ පුරප්පාඩුව පවතින බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීම් කිරීමට සුදුසුකම් සපුරාලන බස්නාහිර පළාතේ පදිංචි පුරවැසියන් වෙතින් අයදුම්පත් 2019.04.25 වැනි දින දක්වා භාරගනු ලැබේ.

අයදුම්පත් ලේකම්, බොරලැස්ගමුව නගර සභාව, බොරලැස්ගමුව යන ලිපිනයට 2019.04.25 වැනි දින දහවල් 12.00ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ තනතුරු නාමය සඳහන් කළ යුතු අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

01. *තනතුරු හා වැටුප් පරිමාණය*:

| | | |
|---|---|---|
| මුරකරු | - | රු. 24,250-10 x 250-10x270-10 x 300-12 x 330 - රු. 36,410/= |
| සෞඛ්‍ය කම්කරු | - | රු. 24,250-10 x 250-10 x 270-10 x 300-12 x 330 - රු. 36,410/= |
| වැඩ ක්ෂේත්‍ර කම්කරු | - | රු. 24,250 -10 x 250 -10 x 270 -10 x 300 -12 x 330 - රු. 36,410/= |
| | | රා.ප.ච 3/2016 (උප ලේඛන 11 අනුව) |

02. *බඳවා ගන්නා ශ්‍රේණිය* : III ශ්‍රේණිය

03. *අධ්‍යාපන සුදුසුකම්* :

**මුරකරු.-** අ.පො.ස.(සා.පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සිංහල /දෙමළ භාෂාව ඇතුළුව සම්මාන 02 සහිතව විෂයයන් 06ක් සමත්වී තිබීම(මින් විෂයයන් 05ක් එකවර සමත් විය යුතුය.)

**සෞඛ්‍ය කම්කරු/වැඩ ක්ෂේත්‍ර කම්කරු .-** 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්වී තිබිය යුතුය.

04. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය .

(ii) වැන්දඹු අනත්දරු හා වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් අරමුදල් සඳහා දායක විය යුතුය.
(ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතු වේ.)

(iii) මෙම තනතුර වසර 03 ක පරිවාස කාලයකට යටත්වේ.

05. *වෙනත් සුදුසුකම්* :

(i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම.

(ii) සෑම අයදුම්කරුවෙකුම බස්නාහිර පළාතේ ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(iii) අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු වීම.

(iv) යහපත් චරිතයකින් යුක්ත වීම.

(v) මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.

06. *වයස් සීමාව* : අයදුම්පත් කැඳවන දිනට අවුරුදු 18ත් 45ත් අතර විය යුතුය.

07. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

මුරකරු :

| ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බඳවා ගැනීමේ දී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතර ලබා ඇති සුදුසුකම් | 20 | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |
| මුළු ලකුණු | 100 | |

**සෞඛ්‍ය කම්කරු,වැඩ ක්ෂේත්‍ර කම්කරු :**

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 5 බැගින්) | 15 | 50% |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |
| මුළු ලකුණු | 100 | |

08. ආයතන සංග්‍රහයේ විධිවිධානවලටද ,මුදල් රෙගුලාසිවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හා රෙගුලාසිවලටද, පළාත් පාලන ආයතනවලට අදාළ ආඥා පනත්වල විධිවිධානවලටද, බොරලැස්ගමුව නගර සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන නියෝගවලටද අනුකූලව කටයුතු කළ යුතුය.

09. මෙම තනතුර සඳහා අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේදී හෝ බඳවා ගැනීම හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල බොරලැස්ගමුව නගර සභාවේ ලේකම් සතුය.

ඊ. ඒ. එච්. එම්. ඇලෙක්සැන්ඩර්,
ලේකම්(රා.ඉ.)

2019 අප්‍රේල් මස 01 වැනි දින,
බොරලැස්ගමුව නගර සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ බොරලැස්ගමුව නගර සභාවේ පුරප්පාඩුව පවතින*
*තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)‍ඃ

02. මුලකුරුවලින් හැඳින්වෙන නම (සිංහලෙන්) : ..............................................................................................................................
..............................................................................................................................

03. මුලකරුවලින් හැඳින්වෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

04. (1) ස්ථිර ලිපිනය (සිංහලෙන්)ඃ..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................

(11) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)ඃ

(111) තාවකාලික ලිපිනය (සිංහලෙන්) : ..............................................................................................................................
..............................................................................................................................

05. උපන් දිනයඃ අවුරුද්ද ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

06. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයසඃ අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

07. ජාතික හැඳුනුම්පත් අංකයඃ ☐☐☐☐☐☐☐☐☐☐☐☐

(උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක් ඇමිණිය යුතුය.)

08 විවාහක/අවිවාහක බවඃ..................................................

09. දුරකථන අංක ඃ- පෞද්ගලික..........................................

10. බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි කාළ සීමාවඃ........................................
(ග්‍රාම සේවා සහතිකය මගින් සනාථ කළ යුතුය.)

11. අධ්‍යාපන සුදුසුකම්ඃ..............................................................................................................................
. ..............................................................................................................................
(සුදුසුකම් සහතික කිරීමට අදාළ සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

12. පළපුරුද්ද:.
..................................................................................................................................................................

13. වෙනත් සුදුසුකම්: (ක්‍රීඩා හා වෙනත්):
..................................................................................................................................................................
..................................................................................................................................................................
(සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සහතික කළ ඡායා පිටපත් ඇමිණිය යුතුය.)

14. (i) ඔබ කිසියම් සාපරාධි වරදක් සම්බන්ධයෙන් කෙදිනකදී හෝ උසාවියකදී වරදකරුවෙකු වී තිබේ ද? (ඔව්/නැත)
(ii) ඔබගේ පිළිතුර ඔව් නම් වරදේ ස්වභාවය හා දඬුවම කුමක් ද?.......................................................
..................................................................................................................................

ඉහතින් මා විසින් සඳහන් කරන ලද කරුණු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටින අතර, කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව මා පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල..................................................III වන ශ්‍රේණියේ තනතුරකට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා..................................................III වන ශ්‍රේණියේ තනතුරකට නුසුදුස්සෙකු වන බවත්,පත්කිරීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියකින් තොරව සේවයෙන් පහ කළ හැකි බවත් මා දනිමි.

..................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :............................ .

*දැනටමත් රාජ්‍ය පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................................ මයා/මිය/ මෙනවිය දැනට................................ ...කාර්යාලයේ/ආයතනයේ......................................... දින සිට මේ දක්වා..................................(තනතුර) වශයෙන් ස්ථිර/තාවකාලික/ අනියම්/(අනවශ්‍ය වචන කපා හරින්න.) තනතුරක සේවය කරන බවද, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දරණ තනතුරින් නිදහස් කරන බවද/නොකරන බව ද ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව සහතික කරමි.

.............................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා
නිල මුද්‍රාව.

දිනය :........................

සහතික කරන නිලධාරියාගේ නම :.......................................................................

තනතුර :..................................................................................................................

ලිපිනය :.................................................................................................................